8513

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2019
## Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 07 | පුරවැසි අධ්‍යාපනය | I ,II | පැය 02යි. |

නම :-................................................................. විභාග අංකය:-..........................................................

සැලකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

### I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රකාශ හරි නම් ( ✔ ) ලකුණ ද, වැරදි නම් ( X ) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

01. සමීප අන්තර් පුද්ගල සබඳතා තුළින් පවුලේ සාමාජිකයෝ එකිනෙකා සමග බැඳී සිටිති. (..................)

02. සාර්ථක ජීවිතයකට අනුචිත දේ නිවැරදිව හඳුනාගෙන ඒවායින් බැහැර විය යුතුයි. (..................)

03. නිත්‍යානුකූල නොවන ක්‍රියාවල නිරතවීම, අසල්වාසීන්ගේ සුහදතාවයට හේතු වේ. (..................)

04. ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා ඩබ්. ඩී. අමරදේවයන් ය. (..................)

05. පාපන්දු ක්‍රීඩාව ලොවට හඳුන්වාදීමේ ගෞරවය විලියම් ජී. මෝගන් මහතාට හිමිවේ. (..................)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

06. ජීවිත සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග හඳුනාගෙන ඒවා අපේ ........................................... ලංකර ගැනීමට අවධානය යොමු කළ යුතුය.

07. ඕනෑම අභියෝගයක් සාර්ථකව ජයගැනීමට නම්, ඒ සඳහා ........................................... තිබිය යුතුයි.

08. ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් අපගේ ........................................... අවශ්‍යතා වේ.

09. අයිතිවාසිකම් භුක්ති විඳීමට ප්‍රථම සමාජය සම්බන්ධයෙන් තම ........................................... ඉටු කිරීම වැදගත් වේ.

10. සමාජය තුළ ජීවත්වීමේ දී විවිධ ........................................... වලට මුහුණ දීමට සිදු වේ.

(උත්සාහයක්, මූලික, අභියෝග, ගැටළු, යුතුකම්, ජීවිතවලට, ආත්මවලට)

● ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

11. දෛනිකව අපට අත්‍යාවශ්‍ය වන වැදගත් තොරතුරු දැනගත හැකි රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ඇමතිය හැකි දුරකථන අංකය

(i) 119 ය. (ii) 1119 ය. (iii) 1919 ය. (iv) 1990 ය.

12. ඕනෑම අභියෝගයක් සාර්ථකව ජයගැනීමට නම්,

(i) එය මඟහැර කටයුතු කළ යුතුය.

(ii) ඒ පිළිබඳව නිරන්තරයෙන් සිතිය යුතුයි.

(iii) ඒ සඳහා පූර්ව සූදානමකින් හා නිශ්චිත වැඩ පිළිවෙළක් අනුගමනය කළ යුතුයි.

(iv) එම කාර්යය කල් දැමීම කළ යුතුයි.

13. ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය සැකසීමේ කමිටුවේ සභාපති ලෙස කටයුතු කලේ,

(i) මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා ය.

(ii) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා ය.

(iii) සර්. ජෝන් කොතලාවල මහතා ය.

(iv) ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා ය.

14. අපේ රටේ ජාතික පුෂ්පය ලෙස නෙළුම් මල භාවිතා නොකරන්නේ,

(i) ඒවා බුදුන්ට පමණක් පූජා කරන මලක් නිසා ය.

(ii) වෙනත් රටක හටගත් මලක් නිසාය.

(iii) එය ඉන්දියාවේ ජාතික පුෂ්පය නිසාය.

(iv) එය ජලයේ හටගන්නා නිසාය.

15. පහත සඳහන් ඒවායින් සිවිල් අයිතිවාසිකමක් නොවන්නේ,

(i) ජීවත්වීමේ අයිතිය. (ii) අධ්‍යාපනය ලැබීමේ අයිතිය.

(iii) අදහස් ප්‍රකාශ කිරීම. (iv) දේශපාලන පක්ෂයකට බැඳීම.

● ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

16. ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා කවුරුන් ද?

.............................................................................................................

17. රොබට් වෝල්ටර් නම් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා අප රටට හඳුන්වා දුන් ක්‍රීඩාව නම් කරන්න.

.............................................................................................................

18. සාරධර්ම පිළිපැදීමේ වැදගත්කම අවධාරණය කරන පද්‍ය කෘතියක් නම් කරන්න.

.............................................................................................................

19. ජාතික කොඩිය අඩකුඹු කරන අවස්ථාවක් ලියන්න.

.............................................................................................................

20. විස්තෘත පවුලක සාමාජිකයන් නම් කරන්න.

.............................................................................................................

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න 4ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5කි.

01. (i) වර්තමානයේ න්‍යෂ්ටික පවුල් ඒකක ලෙස සමාජය සංවිධානය වීමට හේතු වූ කරුණු දෙකක් නම් කරන්න.

(ii) විවේකය ඵලදායි ලෙස ගත කිරීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

(iii) පාරිභෝගිකයකු ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීමේ දී සැලකිල්ලට ගතයුතු කරුණු දෙකක් ලියන්න.

(iv) අපේ රටේ ළමයින් සුරකීමට හා රැක බලා ගැනීමට සිදු කරන ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න.

(v) වර්තමාන සමාජයේ බොහෝ සාමාජිකයන් මුහුණ දෙන අභියෝගාත්මක අවස්ථා දෙකක් ලියා දක්වන්න.

(vi) අභියෝගයකට සාර්ථකව මුහුණදීමට කළ යුතු දේවල් දෙකක් සඳහන් කරන්න.

(vii) අපේ රටේ සංස්කෘතික විවිධත්වයට හේතු දෙකක් ලියන්න.

(viii) සංස්කෘතික දායාදවලට හානි සිදුකරන අවස්ථාවේ දී ඒ පිළිබඳව දැනුම්වත් කළ යුතු අදාළ ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 2 x 8 = 16)

02. (i) වර්තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක ඒවායේ ස්වභාවය අනුව බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) විස්තෘත පවුල් ඒකකයක විශේෂතා හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පවුලක් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ පහක් ලියන්න. (ලකුණු 05)

03. (i) පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබේ ජීවන අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) එම අරමුණු ජය ගැනීමට ඔබ අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) පවුලේ සාමාජිකයකු ලෙස වර්ධනය කළ යුතු යහපත් ගුණාංග පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

04. (i) සෑම ආගමකට අයත් ආගමික වැඩ සටහන්වල ඇති පොදු අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) කළණ මිතුරන් ඇසුරු කිරීම ඔබේ ජීවිත සාර්ථකත්වයට හේතුවේ. කලණ මිතුරෙකු සතු ගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) විවේක කාලය ඵලදායී ලෙස ගත කිරීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) පුද්ගලයකු තුළ හදිසි කෝපයක් මතු වූ විට ප්‍රකාශ වන ඉරියව් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ඔබේ උපන් දිනය අර්ථවත් ලෙස සැමරීමට සිදුකළ හැකි ක්‍රියාකාරකමක් කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

(iii) අයහපත් චිත්තවේග පාලනය කිරීමට කළ හැකි ක්‍රියාකාරකම් පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

06. (i) පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ළමා ශ්‍රමිකයන් සේවයේ යෙදවීමෙන් ඇතිවිය හැකි බලපෑම් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ජන සමාජයේ යහපත සඳහා ඇති නීතිමය යුතුකම් දෙකක් හා සදාචාරාත්මක යුතුකම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 05)

07. (i) ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) සෑම සංස්කෘතියකටම අයත් පොදු ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) අපේ සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)